රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 299

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.

1985 ජූලි මස 23 වැනිදින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
රාජ්‍ය සංස්ථා ප්‍රධානීන් වෙත.

## සේවා මුක්ත භටයින්ට අනුග්‍රහ

රජයේ සේවයේ හා රාජ්‍ය සංස්ථාවන් යටතේ රැකියා ලබාගැනීමට අදහස් කරන සන්නද්ධ සේවාවල සේවා මුක්ත භටයින්ට පහත සඳහන් අනුග්‍රහයන් දිය යුතුය.

(අ) වයස: ඒ මගින් අයදුම් කරන තනතුර සඳහා නියම කර ඇති උපරිම වයස් සීමාව තුලට ගැනීමට හැකිවන්නේ නම් සේවා මුක්ත භටයෙකුගේ වයසින් ඔහු නිත්‍ය බලකායේ සේවය කළ කාලසීමාවට අඩු කිරීම.

(ආ) අධ්‍යාපන සුදුසුකම්: තනතුරක බඳවාගැනීමේ පරිපාටියෙහි දක්වා ඇති අවම අධ්‍යාපනික මට්ටම ඊළඟ පහළ මට්ටම දක්වා අඩුකිරීම.

(ඇ) කාර්මික සුදුසුකම්: කාර්මික සුදුසුකම් නක්සේරු කරන අවස්ථාවන්හිදී, සන්නද්ධ සේවාවන්හි කාර්මික ඒකකවල සේවය කරද්දී ලබාගත් නිපුනත්වය සහ පළපුරුද්ද සැලකිල්ලට ගැනීම.

(ඈ) පත්වීමේ වැටුප: 1983.12.28 දිනැති අංක.233 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සහ ආයතන සංග්‍රහයේ VII වැනි පරිච්ඡේදයේ විධිවිධාන අදාල කිරීම.

02. මෙම චක්‍රලේඛයේ අරමුණ සඳහා "සේවා මුක්ත භටයා" යනුවෙන් අදහස් කෙරෙන්නේ, විශ්‍රාම ගැනීම හෝ සේවා නියුක්ත කාලපරිච්ඡේදය සම්පූර්ණ කිරීම හෝ මත සන්නද්ධ හමුදා සේවයෙන් ඉවත්වූ නිලධාරියෙකු හෝ සේවා භටයෙකි.

03. බඳවාගැනීමේ පරිපාටි මේ අනුව සංශෝධනය කිරීමටත්, තනතුරු පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවීමේ දැන්වීම්වල මේ අනුග්‍රහයන් ඇතුලත් කිරීමටත් පියවර ගතයුතුය.

04. 1958.03.20 දිනැති අංක.434 දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය මින් අවලංගු කෙරේ.

Siriwardhana
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.

සු/-17

2...